දුරකථන / தொலைபேசி / Telephones } 011-2136600 / 011-2136650
ලේකම / செயலாளர் / Secretary } 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2876169 / 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E-mail } info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website } www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
**அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்**
**OFFICE OF THE PUBLIC SERVICE COMMISSION**

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**

මගේ අංකය / எனது இல. / My No. } PSC/EST/05-01-71/01/2013
ඔබේ අංකය / உமது இல. / Your No. } BC/E/01/04/01
දිනය / திகதி / Date } 2023.03.15

අධ්‍යක්ෂ ජනරාල්

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

<u>අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නීති නිලධාරි සේවා ගණය සඳහා වන සංශෝධිත බඳවා ගැනීම් පටිපාටිය</u>

උක්ත කරුණ සම්බන්ධව ඔබේ සමාංක හා 2023.02.09 දිනැති ලිපිය හා බැඳේ.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2014.01.17 දින අනුමත කරන ලද නීති නිලධාරි සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියට මේ සමඟ ඇති ඇමුණුම 01 හි සඳහන් සංශෝධනයන් ඇතුළත් කිරීම සඳහා 2023.03.14 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබාදී ඇති බව එම කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව දන්වමි.

03. තවද, මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, සංශෝධිත බඳවා ගැනීම් පටිපාටිය ඔබ අයතනයේ වෙබ් අඩවියේ පළ කරන ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

ටී.ඩබ්ලිව්. ගයාන්
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත්:

01. ලේකම්, ජාතික වැටුප් කොමිෂන් සභාව - කරු.දැ.ගැ.ස.
02. ආයතන අධ්‍යක්ෂ ජනරාල් - කරු.දැ.ගැ.ස.

ඇමුණුම - 01

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නීති නිලධාරි සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය - සංශෝධන අංක 04

| අනු අංකය | වගන්තිය | සංශෝධනය විය යුතු ආකාරය |
|---|---|---|
| 1. | 1.5 | යොමු අංකය : NSCC/10/87/SR දිනය : 2013.10.21<br>NPC/10/87/SA 2022.03.02<br>NPC/10/87/SR 2022.12.14 |
| 2 | 1.6 | තෙවන සංශෝධනය<br>යොමු අංකය : PSC/EST/05-01-71/01/2013 දිනය : (රා.සේ.කො.ස. විසින් අනුමත කරනු ලබන දිනය ඇතුළත් කරන්න) |
| 3 | 3.2 | ශ්‍රේණි / තනතුරු : සහකාර අධ්‍යක්ෂ (නීති), සහකාර අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 4 | 3.3 | ඇතුළත් කර ඇති ඡේදයට පහළින් පහත ඡේදය ඇතුළත් කරන්න.<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - අභිමතානුසාරි බලය හිමිවන්නා වූ ද ප්‍රතිපත්ති සම්පාදනය, විධානය හා තිරණ ගැනීමේ කාර්යයට සෘජුවම ඇතුළත් වන්නා වූ ද, කාර්යභාරයක් පැවරෙන සේවා ගණයකි. |
| 5 | 5.3 | වගුවට පහත සඳහන් පේළිය ඇතුළත් කරන්න<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් \| පියවර 22 \| 96,990 |
| 6 | 6.1 | වගුවට පහත සඳහන් පේළිය ඇතුළත් කරන්න<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් \| 01 \| අධ්‍යක්ෂ ජනරාල්ගේ එකඟත්වය මත නීති අංශයේ සමස්ත අධීක්ෂණ කටයුතු |
| 7 | 6.2 | තනතුරු තුනට පහළින් පහත තනතුර ඇතුළත් කරන්න.<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් 01 |
| 8 | 7.1 | වගුවේ දෙවන පේළිය පහත පරිදි සංශෝධනය කරන්න.<br>සීමිත \| 50%<br>සටහන :- සීමිත ධාරාව යටතේ සුදුසුකම් සහිත නිලධාරීන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවකදී, එම ඉතිරි පුරප්පාඩු ප්‍රමාණය සඳහා විවෘත ධාරාව යටතේ බඳවා ගනු ලැබේ. |
| 9 | 7.2.2.1 | "අධ්‍යාපන සුදුසුකම්" යන්න ""අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම්" ලෙස සංශෝධනය කරන්න |
| 10 | 7.3 | පහත පරිදි සංශෝධනය කරන්න<br>7.3 සීමිත බඳවා ගැනීම<br>7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : සහකාර අධ්‍යක්ෂ (නීති)<br>7.3.2 සුදුසුකම්<br>7.3.2.1 අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම්<br>ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම<br>7.3.2.2 පළපුරුද්ද<br>අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නීති සහකාර තනතුරට පත්වී වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම |

7.3.2.3 කායික සුදුසුකම්

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණයත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.3.2.4 වෙනත්

I. පත්වීම ස්ථිර කර තිබිය යුතුය

II. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය

III. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව දඬුවමක් ලබා නොතිබිය යුතුය

IV. තනතුරට බඳවා ගැනීම සඳහා 7.3.2 සිට 7.3.3 දක්වා අවශ්‍ය සියළුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් කරුණු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.3.3 වයස

7.3.3.1 අවම සීමාව : අවුරුදු 22

7.3.3.2 උපරිම සීමාව : අවුරුදු 53

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය : යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින්

7.3.4.1 ලිඛිත විභාගය : අදාළ නොවේ

7.3.4.2 වෘත්තිය පරීක්ෂණය : අදාළ නොවේ

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ

7.3.4.4 යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

| ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීම සඳහා සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක වෘත්තිය පළපුරුද්ද | 50 | අදාළ නොවේ |
| අතිරේක සුදුසුකම් | 20 | |
| භාෂා හැකියාව | 15 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන කුසලතාවය<br>(සාමාන්‍ය දැනීම හා බුද්ධිය - 05<br>නීති ක්ෂේත්‍රයේ නූතන ප්‍රවණතා පිළිබඳ දැනුම -05<br>පැහැදිලිව අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව සහ පෞරුෂත්වය -05) | 15 | |
| එකතුව | 100 | |

සටහන :

1. බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවන අවස්ථාවේදී ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පටිපාටියක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් අනුමත කරවා ගැනීමට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කටයුතු

| | | |
|---|---|---|
| | | කළ යුතුය.<br>යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලැබූ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල මත සුදුසුකම් ලබන අයදුම්කරුවන්, පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.<br><br>7.3.4.4.1 යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :<br>රාජ්‍ය සේවා කොමිෂන් සභාව<br><br>7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : ආයතනය තුළ ප්‍රසිද්ධ දැන්වීම පළ කිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ. |
| 11 | 9.1 | චක්‍රලේඛ 01/2014 යන්න 18/2020 ලෙස සංශෝධනය කරන්න |
| 12 | 11.3 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ සිට අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත් කිරීම :<br><br>11.3.1 සපුරාලිය යුතු සුදුසුකම්<br>I. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ වසර පහ (05) කට නොඅඩු සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම හා අවම වශයෙන් එම තනතුරෙහි වැටුප් වර්ධක පහ (05)ක් උපයාගෙන තිබීම<br>II. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ SL-05 වැටුප් කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් වසර 13ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම<br>III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහ (05) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම<br>IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම<br><br>11.3.2 තනතුරට පත් කිරීම :<br>ඉහත සුදුසුකම්ලත් අයදුම්කරුවන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් ඉදිරියේදී පරීක්ෂාවට භාජනය කර අමතර සේවා පළපුරුද්ද සඳහා ලබා ගන්නා ලකුණුවල මුළු එකතුවෙහි කුසලතා අනුපිළිවෙල මත හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත් කරනු ලැබේ. |